INTRODUCING 1st TIME IN UK
FareDeals Travel & Tours
Fly With Someone You Trust
458, Alexandra Avenue, Rayner's Lane, (Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market ( In Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly With us in London

Fly to Colombo

| | |
|---|---|
| Srilankan Air | £ 360* |
| Qatar Air | £ 260* |
| Kuwait Air | £ 220* |
| Oman Air | £ 190* |
| Ethihad Air | £ 350* |
| Jet Air | £ 280* |
| Gulf Air | £ 210* |

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

Fly to London / UK

| | |
|---|---|
| Srilankan | Rs. 85000* |
| Qatar | Rs. 62000* |
| Kuwait | Rs. 56000* |
| Royal Jor | Rs. 58000* |

Special Student Offers (o/way)

| | |
|---|---|
| Srilankan | Rs. 50000* |
| Qatar | Rs. 58000* |
| Kuwait | Rs. 41200* |

* Fares subject to taxes/change

Call Dulip or Sidath
0208 150 3343
0800 612 4045

Emergency Travel ctc Dulip
07551 549 559
info@faredealtravels.co.uk
www.faredealtravels.co.uk

FareDeals Rent-A-Car in Sri Lanka
Book a Car or Van for your Holiday (Self & Chauffeur Driven)

- 3 Day / Weekly / Monthly Rentals
- Low / Competitive Rates
- Breakdown Replacement Available
- Pick from Airport / Our Office
- We can deliver to your doorstep*

*Conditions apply



Call - Dulip or Kasun
for more Details..
0208 150 3343



# ස්තූතිකිරීමයි !
# Thank you!

## එවන්ස් ගුණලාල් කුරේ මහතා
## Mr Evans Gunalal Cooray



පසුගිය අගෝස්තු මස අභාවප්‍රාප්ත වූ **එවන්ස් කුරේ** මහතාගේ වියෝගය අවස්ථාවේ අප සිත සහනයට පත්කරමින් කණගාටුව බෙදාගත්, එසේම පැමිණීමෙන්, දුරකථන මගින් හා මල්වඩම් එවීමෙන් ශෝකය ප්‍රකාශ කළා වූත් ලන්ඩනයේ පැවති අවමංගල්‍යයට සහභාගිවූත් සියලුම පූජක පක්ෂයට ද, එක්සත් රාජධානියේ ශ්‍රීලංකාවේ හා වෙනත් රටවල වෙසෙන සියළුම නෑදෑ හිතමිත්‍රාදීන්ට ද අපේ හදෘයාංගම ස්තූතිය මෙසේ පුදකරනු කැමැත්තෙමු.

නන්දා (බිරිඳ) සමන්ත(සෑම්), රසන්ත (පුතුන්) සහ සාදනී (දියණිය)
**Kingsbury, London**

# දස වසර සාදර සිහිකිරීමයි !

## නීතිඥ පරාක්‍රම රණසිංහ මහතා
## Mr Parakrama Ranasinghe



ඔබේ වියෝගයෙන් මේ මසට දස වසරක් සපිරේ. අපි ඔබ සැමදා ආදරයෙන් සිහිකරන්නෙමු. ඔබ අපේ හදවත්හි සදා ජීවත්වේ.

අදරැති බිරිඳ මානෙල් ජිත් හා තුෂාර පුතුන් ඇතුළු පවුලේ සැම සහ ලන්ඩනයේ හිතමිතුරන්
**Kingsbury, London**

# ♥ පැටියො ඩාලිං



" පැටියො අපේ ලොකු අක්කා ටෙලිපෝන් කරලා කිව්වා ලංකාවට දැනුණු ලොකුම ලැජ්ජාව ගිය සතියෙ ක්‍රිකට් වර්ල්ඩ් කප් එක අපි පරාද වුනාට වැඩිය මැච් එක දිනපු ගමන් ඒ කල්ලො ටික සේරම බෙත්තාරාම පිට්ටනියෙ එදා හිටපු දෙනෝ දාහක් සෙනගට පස්ස පෙන්න පෙන්න කැලිප්සෝ නැටුම් නටපු හැටියටය කියලා. "

# Sinhala Lesson 35 සිංහළ පාඩම
## සිංහල ඉගෙනීමට පහසු මගක් !

**Now you have learnt most of the Sinhala letter sounds and the vowel-strokes. Use your Letter - Sound key to read aloud the words below :**

ඒක - that ඒඩන් - Aden ඒවා - those things
කේක් - cake කේතලය - kettle කේජු - cheese
ගේන්න - bring ගේට්ටුව - gate මගේ - my
චේතනාව - intention චේතිය - pagoda
ජේන් - Jane වැඩේ - work කඩේ - boutique
තේ - tea තේක්ක - teak තේරුම - meaning
දේවල් - things පේළි - lines බේසම - basin
මේසය - table ඊයේ - yesterday ලේසි - easy
වේගය - speed සේරම - all හේතුව - reason

**Learn to read & understand and use atleast five new words everyday.**

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 141

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | | 3 | 4 |
| 5 | | ■ | 6 | |
| 7 | | 8 | | ■ |
| | ■ | 9 | | 10 |
| 11 | | | | |

**හරහට :**
1 දත් වලට සම්බන්ධයි
5 ශාලාව
6 උපදින විටම සමහරුන්ට මෙය පිහිටයි
7 බඩගා යන සතෙක්
9 දිව්‍යලෝක හයෙන් එකක්
11 අනාගතයේදී සිංහළයාට අත්වන ඉරණම මෙයයි

**පහළට :**
1 සීතාවක රාජසිංහ රජුගේ මරණයට මෙය හේතුවිය
2 ලබන්නට ඉතාමත් අමාරු
3 සිංගප්පූරුවට ළඟම රට
4 ඉතිරිවන රොඩු
8 ලැජ්ජාවට හෝ තරහට මුහුණ මෙසේ වී යයි
10 අනුන්ගේ නොවන

***ගියවර නිවැරදි විසඳුම්***
**හරහට :** 1 හමුදාව 5 රත්නපුර 7 බතා 8 රට 9 කනක 10 මල්වාන
**පහලට :** 1 හරබර 2 මුත්තා 3 දාන 4 වපුරනවා 6 රටකන 9 කල්

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# චීන ක්‍රමයට මාළු
# Sweet & Sour Fish

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| කටු නැති මාළු ග්‍රෑම් | 500 ක් |
| මුදවාගත් කිරි මේස හැඳි | 3 ක් |
| මිරිස් කුඩු තේ හැඳි | 1 ක් |
| තුනපහ කුඩු තේ හැඳි | 1½ ක් |
| තලාගත් සුදුළූණු බික් | 3 ක් |
| අඹ චට්නි මේස හැඳි | 2 ක් |
| ලුණු තේ හැඳි | 1 ක් |
| සීනි මේස හැඳි | 2 ක් |
| වතුර කෝප්ප | 2 ක් |
| අමු මිරිස් කරල් | 2 ක් |
| කොත්තමල්ලි කොළ ස්වල්පයක් | |
| තක්කාලි සෝස් මේස හැඳි | 3 ක් |
| පොල්කිරි කෝප්ප | ½ ක් |
| මාජරින් මේස හැඳි | 1 ක් |

***සාදන ක්‍රමය :*** බඳුනක් ගෙන එයට තක්කාලි සෝස්, මුදවාපු කිරි, තුනපහ කුඩු, මිරිස් කුඩු, සුදුළූණු, අඹ චට්නි, සීනි හා ලුණු ආදිය දමා කළවම් කරන්න. තවත් සුදුසු බඳුනක් ගෙන එයට මාජරින් දමා ලිප තබා තෙල් හොඳින් රත් වූ විට එයට ඉහත කී මිශ්‍රණය දමා විනාඩි දෙකක් පමණ පිසින්න.
ඉන්පසු සෝදාගත් මාළු කැබලි එයට දමා, වතුර ද එක්කර හොඳින් පිසගන්න. ඊට පොල්කිරි ද එක්කරන්න. තරමක් ඉස්ම හිඳුණු පසු කුඩාවට කපාගත් අමු මිරිස් සහ කොත්තමල්ලි කොළ ඊට එක්කරගන්න.

♦ ***පුෂ්පා රණවීර*** Sri Lanka

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සෑම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432